# තුම්පනේ ප්‍රදේශයට අයත් ටැම්පිට විහාර සිතුවම් පිළිබඳව අධ්‍යයනයක්.

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ඊ.ඩී. අනුරාධා අබේසේකර*[1]
*උදා හෙට්ටිගේ*[1]

සංක්ෂේපය

වර්තමාන ව්‍යවහාරයෙන් මධ්‍යම පළාතට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ඡන්දබල කොට්ඨාශය පුරාණ බෙදීම් අනුව ''තුම්පනේ රට'' යනුවෙන් හඳුන්වයි. මෙහි උඩ පළාත , පල්ලෙ පළාත හා ගංඅට පළාත යනුවෙන් එකල ප්‍රාදේශීය බෙදීම් තුනක් යටතේ පාලන කටයුතු සිදු වී ඇත. ඒ බව මෙහි පිහිටා ඇති ටැම්පිට විහාර සංඛ්‍යාව අනුව තව දුරටත් තහවුරු වන අතර මහනුවර දිස්ත්‍රික්කයේ කුඩා භූමි ප්‍රමාණයක් තුළ පිහිටි වැඩිම ටැම්පිට විහාර සංඛ්‍යව මෙම ප්‍රදේශයට අයත් වේ. ඒ අනුව, ක්ෂේත්‍ර අධ්‍යයන , සම්මුඛ සාකච්ඡා හා ලිඛිත මූලාශ්‍ර මඟින් මහනුවර යුගයට අයත් සිතුවම් , සම්ප්‍රදායන් හා ශෛලීන් පිළිබඳව මෙහිදී අධ්‍යයනය සිදු කරන ලදි. වැලිගොඩපොළ පුරාණ විහාරය , දුංකුඹුර පුරාණ විහාරය , මිණිගමුව විහාරය , වැලිවිට සාංඝිකාරාමය , කලෝටුවාව පුරාණ විහාරය හා මුරුද්දෙනිය කන්දපිට විහාරය යන ටැම්පිට විහාර සය අධ්‍යයන සීමාවට යටත් වූ අතර, මීට අමතරව මේ වන විට විනාශ වී ගොස් ඇති ටැම්පිට විහාර කිහිපයක සාධකද ප්‍රදේශයෙන් හඳුනාගත හැකි වේ. මෙයින් මුරුද්දෙනිය කන්දපිට විහාරය හැර සෙසු විහාරස්ථාන සියල්ලෙහිම අන්තර්ගත සිතුවම් මහනුවර සම්ප්‍රදායට අයත් සියලුම ලක්ෂණ ප්‍රකට කරවයි. ඒ අනුව පොදුවේ විමර්ශනය කළ විට මෙම විහාර අතර ප්‍රාදේශීය වශයෙන් සමාන ලක්ෂණ දැකගත හැකි වුවද ශිල්පීය විවිධත්වය මත වෙනස් ශෛලීන් කිහිපයක්ද හඳුනාගත හැකි වේ. එක් එක් විහාරයන්හි ඓතිහාසික තොරතුරු හා ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ අනුව ඇඳ ඇති සිතුවම්ද පූර්ණ වශයෙන් මහනුවර සම්ප්‍රදායට අයත් වන බව කිව හැකි වේ. එසේම, සාංඝිකාරාම විහාරයෙහි සිදු කර ඇති අවිධිමත් සිතුවම් සංරක්ෂණ කටයුතු හේතුවෙන් මහනුවර යුගයට අයත් සිතුවම් සියල්ලම විනාශ වී ගොස් ඇති අතර එහි පුරාවිද්‍යාත්මක වටිනාකමටද හානි සිදු කරමින් පශ්චාත් කොළඹ යුගයට අයත් සිතුවම් ඇඳ ඇත. එහෙත් විහාරයට අයත් තල්පතක් අනුසාරයෙන් එහි පුරාණයේ ඇඳ තිබූ මහනුවර යුගයට අයත් සිතුවම් පිළිබඳව පූර්ණ අවබෝධයක් ලැබිය හැකි වේ. ඒ අනුව මෙම විහාර සියල්ලම මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් අධ්‍යයනය කිරීම සඳහා වූ අපූරු කලාගාර වශයෙන් හැඳින්වීම වරදක් නොවේ.

ප්‍රමුඛ පද : තුම්පනේ , ටැම්පිට විහාර, මහනුවර යුගය, සිතුවම්

1. පුරාවිද්‍යා අධ්‍යයන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය ,70chanaka@gmail.com
2. පුරාවිද්‍යා අධ්‍යයන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය , uhettige@yahoo.co.uk